
# ලන්ඩන් කවි
## LONDON KAVI

14A, Buckingham Palace Road, London SW1W 0QP
Tel: 020 7630 6600, Fax: 020 7630 6645
Free Circulation - Vol 2 Issue 10 April- May 2006



'මගේ කුඩා සිහිනය' ඡායාරූප ලාල් හෑගොඩ. මේ ඡායාරූපයට ඔබ නිර්මාණය කරන කවිය හෝ කවි පෙළ සඳහා මීළඟ ලන්ඩන් කවි මුල් පිටුව වෙන් වී තිබේ.

### අයන්න කියන්න

අ යන්න කියන්න
ලොවටම ඇහෙන්න
එන්න මගේ මල්ලී
දුවන්න පනින්න නටන්න ගයන්න
එන්න මගේ නංගී

පාසල නම් රන් දෙවොලේ
දෙවියන් වන් ගුරු කැලගේ
සිත දිනමින් පා සෙවනේ - ශිල්ප ලබා මතු දවසේ
ඥානය වඩන්න - කාලය ගෙවන්න
එන්න මගේ නංගී
එන්න මගේ මල්ලී

කාසි පනම් හිටි හැටියේ
සතුරෝ ගෙන යති රහසේ
පොතින් පතින් ලද දැනුමේ - ධනය සදාකල් සුරැකේ
ලෝකය දකින්න - එහි සැරිසරන්න
එන්න මගේ මල්ලී
එන්න මගේ නංගී

තනු නිර්මාණය සහ සංගීතය / මර්වින් පෙරේරා
ගායනය / නන්දා මාලිනී

### නංගියේ මල්ලියේ

නංගියේ මල්ලියේ
මල්ලියේ නංගියේ
මට දෙන්න මගෙ පුංචි කාලේ

වැලි බත් උයන්නම් සැඟවී සිටින්නම්
මාදම් කැලෑවේ පලු වීර වදුලේ
කවි ගී අසන්නම් ඇකයේ රැඳෙන්නම්
මවුගේ තුරුල්ලේ උණුසුම් කැදැල්ලේ

නිල්වන් ජලාසේ කිමිදී ගිලෙන්නම්
විහඟුන් විලාසෙන් හිනැහී ඉගිල්ලී
පාසල් වෙලාවේ පාඩම් කරන්නම්
වේවැල් කසායෙන් දඟයෙන් මිදීලා

නංගියේ මල්ලියේ
මල්ලියේ නංගියේ
මට දෙන්න මගෙ පුංචි කාලේ

තනු නිර්මාණය සහ සංගීතය / වික්ටර් රත්නායක
ගායනය / වික්ටර් රත්නායක



මහාචාර්ය සුනිල් ආරියරත්න
ගී සැඳෑව

# 'ලන්ඩන් කවි'


අනුග්‍රහයෙන්
2006 මැයි 06 දා සවස 1.45-5.45 දක්වා
වෙස්ට්මින්ස්ටර් විශ්වවිද්‍යාලයීය
හැරෝ මණ්ඩපයේ දී

කථන
'කවිය සහ ගීතය'
රාජ්‍ය සම්මාන ලත් ගීත රචක
**මහාචාර්ය සුනිල් ආරියරත්න**

'ගීතය තුළ කවිය'
රාජ්‍ය සම්මාන ලත් කාව්‍ය රචක
**ලාල් හෑගොඩ**

## ගායනා


සංජීව පෙරේරා



අනුර කළුබෝවිල


නීතිඥ වසන්ත තෙන්නකෝන්



නීතිඥ ක්‍රිශ්මාල් වර්ණසූරිය


වෛද්‍ය කුසුම් සුබසිංහ


ජගත් ජයතිලක


වෛද්‍ය මනික් ප්‍රනාන්දු


සමන්මලී වෛද්‍යරත්න


සමන් හෙට්ටිආරච්චි


නිශාන්ති ප්‍රනාන්දු


රොෂෙල් සමරවීර


ශ්‍යාමා කළුආරච්චි


අනුලා පෙරේරා

**සුනිල් ගී සැඳෑව වෙනුවෙන් මෙවර ලන්ඩන් කවි කලාපය වෙන් වන්නේ මහාචාර්ය සුනිල් ආරියරත්නයන් ගේ ගී අතරින් කිහිපයක් සහ ලාල් හෑගොඩ ගේ කාව්‍ය සංග්‍රහයන් ගේ කවි අතරින් කවි කිහිපයකට ය.**

## සුදු හාමිනේ

සුදු හාමිනේ නුඹ කොතැනද අද දවසේ
දීගෙක ගිහින් දරු පිරිවර මැද සුවසේ
ලේලිය සමඟ මගෙ පුතු වෙන් විය රහසේ
මං විතරයි තනියම දැන් මගෙ නිවසේ

නුඹලගෙ තාත්තා ඈත දුර බලාගෙන
කවදා දූ පුතුන් ඒ දැයි පතාගෙන
වේවැල් කැඩුණු පුටුවේ වක ගසාගෙන
මං ඉන්නවා නෙත කඳුළැලි දරාගෙන

දරුවන් ඇඳුම් ඇඟලුම් ගෙන සිඹින්නෙමී
මනසින් එදා කෙළි සෙල්ලම් දකින්නෙමී
මරණයෙ දොරකඩට සපැමිණ සිටින්නෙමී
ලේ කිරි පෙවූ දරුවන් දැක මියෙන්නෙමී

**තනු නිර්මාණය සහ සංගීතය / නන්දා මාලිනී**
**ගායනය / නන්දා මාලිනී**

## හිත මිතුරු සුළඟ

හිත මිතුරු සුළඟ ළඟ එන වැහි වලාවට කියන්
අද නො පැමිණ
අන් දිනයෙක වැසි රැගෙන එන ලෙසින්
දිගු කලෙකින් ඈ මුණ ගැසේවි හසඟනක් වෙසින්
වැසි වැටුණොත්
ඒ සොඳුරු මොහොත අඳුරු වේ සැණින්

වීදි පුරා වතුර පිරෙයි
හෙමින් හෙමින් මුමුණ මුමුණ ඇවිද යම් කෙසේ
තණ නිල්ලේ ගොහොරු සැදෙයි
කතා නැතිව අනන්තයට ඉගිල යම් කෙසේ

අප සමුගත් පසු වසින්න
ගං හෝ වැව් ඉපිල ඉපිල ඉතිර යන තුරා
හෝරා දෙක තුනක් ඉන්න
නෑවිත් වැහි වලා බඳේ ඉමෙන් මෙහා

**තනු නිර්මාණය සහ සංගීතය / වික්ටර් රත්නායක**
**ගායනය / වික්ටර් රත්නායක**

## ගාට ගාට ඇවිදින්

ගාට ගාට ඇවිදින් ඇස් දෙක වහලා හිනා වෙන්න
ආදරේට කොනිත්තලා පෑල දොරින් පැන දුවන්න
රෑටරෑට ඉහ ඉද්දර කොඳුර කොඳුර කවි කියන්න
පාටපාට පන් පැදුරේ මටත් ටිකක් ඉඩ තියන්න

හාල් ගරන්නත් පුළුවං වතුර තියන්නත් පුළුවං
ඇට්ටකුණා වෙන්නෙ නැතුව බතක් උයන්නම්
හොදි ඒදන්නත් පුළුවං
කූරු ගාන්නත් පුළුවං
අඩුගානේ කිරි හොද්දක් හදල තියන්නම්

මල් හිටවන්නත් පුළුවං වල් ගලවන්නත් පුළුවං
පහන් පැලක් වගේ ගෙපැල සුවඳ කරන්නම්
හොඳට අඬන්නත් පුළුවං
නාඬම ඉන්නත් පුළුවං
ටික දොහකිං දරු පැටියෙක් තෑගි කරන්නම්

**තනු නිර්මාණය සහ සංගීතය / රෝහණ වීරසිංහ**
**ගායනය / දීපිකා ප්‍රියදර්ශනී**

## දුලීකා

සීත රෑ යාමේ අඳුරේ
වාසනා නිල් දෑස පායා
ආදරේ උණුසුම් සුසුම් වැල්
මා හදේ රහසේ රැඳුණා

මා බලා සිටියා දිවා රෑ
කල්පනා යහනේ
නෑ එවන් රුව තාම දුටුවේ
නාඳුනන සිහිනේ

මා ඔබේ හස රැල් ජලාසේ
කිමිදෙනා මොහොතේ
ඔබ සොයා එන්නම් ඉගිල්ලී
තාරකා එළියේ

**තනු නිර්මාණය සහ සංගීතය / ප්‍රේමසිරි කේමදාස**
**ගායනය / සනත් නන්දසිරි**
**චිත්‍රපට අධ්‍යක්ෂ / කේ. ඒ ඩබ්ලිව්. පෙරේරා**

# මහාචාර්ය සුනිල් ආරියරත්න

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ කලාකරුවෙකි. ගීතය, කවිය, සිනමාව ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක ම අසාමාන්‍ය කුසලතාවන් දැක්වූ සුනිල් ආරියරත්නයන් ගීතය හා අනුබද්ධිත ක්ෂේත්‍රය පිළිබඳ පර්යේෂණයෙහි යෙදුණු එක ම ශ්‍රී ලාංකික මහාචාර්යවරයා වන අතර ඔහු නොමැති ව විද්වත් සංගීත කතිකාවතක් දක්නට නො ලැබේ.

1949 ජූලි 28 වන දා උපන් ආරියරත්නයන් නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සිංහල භාෂාව පිළිබඳ පළමු පන්තියේ උපාධියක් ලැබී ය. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය-වරයෙකු ලෙස තම වෘත්තීය ජීවිතය ඇරඹි ඔහු අනතුරු ව යාපනය විශ්වවිද්‍යාලයේ ද කලක් සේවය කළේ ය. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය උපාධිය ලැබූ ඔහු අද එහි සිංහල අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයා වෙයි. සංගීතය පිළිබඳ ඔහු දැක්වූ උනන්දුව ඉන්දියාවේ භාත්ඛණ්ඩ සංගීත ආයතනයෙන් සංගීත විශාරද උපාධිය ලබා ගැනීම දක්වා දීර්ඝ විය.

ගීත, සංගීත සිනමා ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වයක් දැක්වූ ඔහු මෙතෙක් ලියා ප්‍රකාශනයට පත් කර ඇති ග්‍රන්ථ සංඛ්‍යාව පනහකට අධික ය. නිර්මාණය කර ප්‍රකාශ කළ ගීත කැසට්පට හා සංයුක්ත තැටි සංඛ්‍යාව දහතුනකි. නිර්මාණය කළ චිත්‍රපට සංඛ්‍යාව දාහතකි.

සාහිත්‍ය, සාහිත්‍ය පර්යේෂණ, ගීත, සිනමා ක්ෂේත්‍රයන්හි නිර්මාණ වෙනුවෙන් ඔහු ලැබූ සාහිත්‍ය සම්මාන තිස් අටකි.

මහාචාර්ය සුනිල් ආරියරත්නයන් ගේ නිර්මාණ ජීවිතය පිළිබඳ සංක්ෂිප්ත සටහනකි මේ.

## හිත හීලෑ නෑ

හිත හීලෑ නෑ
හරිම මුරණ්ඩුයි
තැන තැන ඇවිදිනවා
හිතෙන හිතෙන තැන
නවතිනවා
හිත ඉගිලෙනවා
කාශ්මීරයේ සුදු හිම කඳු අතරේ
මා තනිවෙනවා
පා යුග දවනා නිරුදක වැලි කතරේ
මා සැතපෙනවා
මා පිය ළඳගේ මුදු උණුසුම් උකුළේ
හිත හිනැහෙනවා
මා මඟ තොට දී දුටු ළඳකගෙ තුරුලේ

**තනු නිර්මාණය සහ සංගීතය / වික්ටර් රත්නායක**
**ගායනය / බන්දුල විජේවීර**

## මීනා

බණ්ඩාරේ :
මීන නුවන් යුගින් බලන්
මීනා
ගල් අරඹේ තල් පවුරින්
එබී බලන්
මීනා

මීනා :
බලන්න බෑ බණ්ඩාරේ
උඩරට කුල නිල බල ඇති
බණ්ඩාරේ

මීනා :
ඔබ කෝවිල් එන්නෙත් නෑ
මට පන්සල් යන්නත් බෑ
අපි ඈතයි අපි ඈතයි
බණ්ඩාරේ

බණ්ඩාරේ :
අත් වැල් බැඳ කෝවිල් යමු
පෝය දාට පන්සල් යමු
මෘදංග නද ගැට බෙර හඬ
අපගේ දෙසවනට එකයි

**තනු නිර්මාණය සහ සංගීතය / වික්ටර් රත්නායක**
**ගායනය / වික්ටර් රත්නායක සහ නිරංජලා සරෝජිනි**

## යෞවනයේ ඇදුරුතුමිය

දෛවයෝගයකින් නොවේදෝ
හමු උනේ අප හමු උනේ
දෛවයේ සරදම් ලබන්නට
කිම මෙසේ අප හමු උනේ

ඇදුරුතුමියයි ප්‍රේමයේ ඔබ
ඇදුරුතුමියයි යෞවනේ
සෝකයේ රුදු වේදනාවේ
කඳුළු සයුරේ
උල්පතයි
නඳුන් උයනයි ස්නේහයේ ඔබ
සඳුන් සිලිලයි ජීවිතේ
සොම්නසේ ආනන්දයේ
හසරැල් තරංගේ
උල්පතයි

**තනු නිර්මාණය සහ සංගීතය / වික්ටර් රත්නායක**
**ගායනය / වික්ටර් රත්නායක**

## රත්තරං

යනවානං අනේ මං අරං
යන තැනකට යන්න රත්තරං
හිඟා කකා කොළපතක් අරං
ලුණුයි බතුයි කමුකො රත්තරං

සීත හිමේ කඳු පාමුල
හින්දි සින්දුවක් කිය කිය
හිඟාන ආ ලුණුයි බතුයි කමුකො රත්තරං
ඊට පස්සෙ දුන්හිඳ ළඟ නටමු රත්තරං

සතය සතය එකතු කරලා
රහසේ කැටයකට දමලා
නුවර එළියෙ ටජ් මහලක් හදමු රත්තරං
සාරි ඉරලා ජනෙල්වලට දමමු රත්තරං

**තනු නිර්මාණය සහ සංගීතය / රෝහණ වීරසිංහ**
**ගායනය / නන්දා මාලිනී**

## කලිඳු ගංගා දෙණියේ

කලිඳු ගංගා දෙණියේ වන තීරේ
ගෝවින්ද කොතැන සැඟවුණිද මට නොතේරේ
පියතුමනි නන්ද! හා! කොහිද ඔබේ පුතනු
මා ඔහුගේ ප්‍රියාවයෑ සැඟවුණු තැන කියනු

පලුපත් යහනකි මේ ඔහු සැතපුණු
ඔහුගේ සිරුරේ සුවඳයි මේ
ළඳකගෙ මිණි කොඩොලේ සුන්බුන් මේ
හා! හා! බැඳුණි ද කාමිනියක හා

නිල් දිය පොකුණකි මේ ඔහු කිමිදුණු
ඔහුගේ සිරුරේ සුවඳයි මේ
ළඳකගෙ මිණි මෙවුලේ මුතු ඇට මේ
හා! හා! බැඳුණි ද කාමිනියක හා

**තනු නිර්මාණය සහ සංගීතය / රෝහණ වීරසිංහ**
**ගායනය / චන්ද්‍රලේඛා පෙරේරා**
**(ඩී.බී.නිහාල් සිංහගේ 'රේඛා' ටෙලි නාටකයෙනි)**

## මඩොල් දූව

කොහේද කොහේද අපේ ලොවක්
කොහේද කොහේද අපේ රටක්
මුරකාවල් නැති වැට කොටු බැමි නැති
අපේ ම අපේ ම නවාතැනක්

රාජ කුමාරයන් කුමාරියන් ඉන්න පළාතක්
නපුරු රාස්සයන් රාස්සියන් ඉන්න කැලෑවක්
පුංචි සුරංගනාවන් සැඟවී ඉන්න වලාවක්
අපට හිතුමතයේ රජ කර ගෙන ඉන්න දිහාවක්

කිඳුරු විමානයට පාර ළඟයි එන්න යාළුවේ
මුදු හතක් එහා ඔරු පදින්න එන්න යාළුවේ
මකර කටෙන් නාග බවනට යමු එන්න යාළුවේ
අපි ම අපේ ලොවක් සොයා ගන්න එන්න යාළුවේ

**තනු නිර්මාණය සහ සංගීතය / අමරදේව**
**ගායනය / වික්ටර් රත්නායක ඇතුළු පිරිස**
**චිත්‍රපට අධ්‍යක්ෂ / ලෙස්ටර් ජේම්ස් පීරිස්**

## ඉරට අකීකරු

ඉරට අකීකරු හඳට අකීකරු
රෝස කැලේ රතු කැකුළී

එකමත් එක රටකින් ඔහු ඒවී
ඔබ ගෙන ඈතට යන්නට යාවී
කඳුළැලි ගඟ ළඟ ඉකි බිඳ නාඩන්
රෝස කැලේ රතු කැකුළී

දෙතොලේ පොපියන ගීය ගයන්නට
දෑසේ නලියන කඳුළු සලන්නට
ලස්සන දවසක් හෙට හමු වේවා
රෝස කැලේ රතු කැකුළී

**තනු නිර්මාණය සහ සංගීතය / සරත් දසනායක**
**ගායනය / ඉන්ද්‍රානි පෙරේරා**
**චිත්‍රපට අධ්‍යක්ෂ /රංජිත් පෙරේරා**

# ලාල් හෑගොඩ

ශ්‍රී ලංකා ප්‍රමුඛ පෙළේ ඡායාරූප ශිල්පියෙකි. ඡායාරූප ශිල්ප ගුරුවරයෙකි. ශ්‍රී ලංකා ඡායාරූප අධ්‍යාපනයෙහි පුරෝගාමී වූ හා කොළඹ යුගයේ කවියෙකු වූ විල්සන් හෑගොඩ ශූරීන් ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රයා ය.

1947 ජූලි 04 දා උපන් ඔහු පියා ගෙන් ඡායාරූප කලාව සහ කවිය උරුම කොට ගත්තේ ජානමය උරුමයක් ලෙසින් විය හැකි ය. නමුත් ඡායාරූපකරණය ඉගැන්වීමෙන් එහි නවීනතාවන් ද, ඡායාරූප කලාවෙහි නව කලාත්මක ඉදිරිපත් කිරීමක් ද, කාව්‍යකරණයේ නිදහස් පිළිවෙතක් ද ඔහු සතු විය.

'මා මිනිසෙක් ඔබ ගඟක් නිසා' ඔහු ගේ ප්‍රථම කාව්‍ය ග්‍රන්ථයට 1998 දී වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි විය. ඔහු පසළොස්වක සඳ මගේය හා සඳුන් අරටුව දැල්වූයේ ඔබයි යන කාව්‍යය ස්වාධීන සාහිත්‍ය ගඟ වක් වී ගලන තැන ඔහු ගේ හතර වන කාව්‍යය සංග්‍රහය උළෙලේ දී සම්මානයට පාත්‍ර විය. ඡායාරූප ශිල්පය හා කලාව නමින් 1999 දී ඔහු ප්‍රකාශයට පත් කළ ග්‍රන්ථය, ඡායාරූපකරණය පිළිබඳ සිංහලයෙන් ලියවුණු එක ම සම්පූර්ණ ග්‍රන්ථයකි. එය ලංකාවේ ගුරුවරුන් ගේ අත්පොත ලෙස භාවිත කරයි. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ආසියාවේත්, යුරෝපයේත් ජාත්‍යන්තර සමුළු ගණනකට ම සහභාගි වී ඇත. ඉතාලියේ සැන් මැරිනෝ දී පැවැති එවන් සමුළුවක දී ඡායාරූප කලාව පිළිබඳ ඔහු ඉදිරිපත් කළ පත්‍රිකාවට ජාත්‍යන්තර ඡායාරූප කලා සමිති සම්මේලනයේ ඉහළ ම සම්මානයක් වන ES. FIAP සම්මානය ප්‍රදානය කෙරුණි.

සමාජ සංවිධාන රාශියක හා ඡායාරූප සංවිධාන කීපයක ක්‍රියාකාරී නිලධාරියෙකු වූ ලාල් දැනට - ශ්‍රී ලංකා නිර්මාණ ඇගයීම් සුරැකීමේ සංවිධානයේ හා හරිත දර්ශන (පරිසරය සුරැකීම පිළිබඳ කලාකරුවන් ගේ සංවිධානය) සංවිධානයේ විධායක අධ්‍යක්ෂ වෙයි.

මේ වසරේ දෙසැම්බර් මාසය පුරා බ්‍රිතාන්‍ය රාජකීය ඡායාරූප සංගම් මූලස්ථානයේ දී ඔහු ගේ ඡායාරූප ප්‍රදර්ශනය වෙයි.

## හිරු මව

හිරු මව
උදෑසන එන්නේ
කිරිත් අරගෙන
සතුන්ට මිනිසුන්ට තුරුලතාවන්ට

එන ගමනේ
මන්දිරයේ සඳලු තලයට නැඟ
එබී කවුළුවෙන්
තිරය මෑත් වූ තැනින්
පිබින්නේ පුරුද්දට
ඒ සොඳුරු මුහුණ

වැසී ඇතියෙන්
තරුණ මිනිසෙකුට
ඒ කුසුම
සිඹිනු නොහැකිය අද

පා සිනාවක්
ඉවත් වන්නේ හිරු මව එතැනින්
**(සඳුන් අරටුව දැල්වූයේ ඔබයි කාව්‍යය සංග්‍රහයෙනි)**

## ලිහිණි තනි

සිතිජයක් නැති රැයේ
සාගරය මත අන්ධකාරයේ
කුණාටුවේ
අකුණු සැරෙන් පෙනුණේ
පියාසර ලිහිණි තනි

දිගු යොදුන්
දිගු රැයේ
ගොඩබිමක් නැති කැක්කුමේ
වර්ෂාවේ
තෙහෙට්ටු වී තෙත බරිත වී
කඩා වැටුණා ගිලුණා සයුරේ
ලිහිණි තනි
**(සඳුන් අරටුව දැල්වූයේ ඔබයි කාව්‍යය සංග්‍රහයෙනි)**

(මාතෘකාවක් නැත)
බාල දැරියගේ
අවමඟුල් පෙරහැර
එගොඩ වෙයි ඔයෙන්
දමා වැඩිපුර කොටයක්
සැදූ වීදණ්ඩෙන් අලුත්

ඔය ගලයි සෙමින්

වළාකුළු ඇදෙනා ඔයෙහි
සෙමෙන් ඇදෙයි
වැඩිහිටි දුර්වර්ණ
සුදු ඇඳුම්

උණ පඳුර ඉවුරේ
එතනමය
තවමත්

ඔය ගලයි සෙමින්

කුරුල්ලෙක් පියාඹයි දියෙහි
**(සඳුන් අරටුව දැල්වූයේ ඔබයි කාව්‍යය සංග්‍රහයෙනි)**

## වේදනා අපමණ

බිරිඳ අත කණ වැලට ගෙන
පිය ගැට පෙළ නඟින මට
දැනෙන වේදනා අපමණ

හෝරාවක් අඳුරු කර
විදුලිය සිඳුණු මොහොතේ
නැඟගේ පෙර දිනක
මෙලෙස මේ විදියටම හෝ
නොවෙද

ලොවම පහන් වූ දවසක
වසාගෙන නෙත් අන්ධයකු වී
මඳකට
පුරුදු දැයි පියගැට
බැලූයෙමි නාල්ලා අත්වැල

දහසක් පාද සිප
මැදුණු බිම
දැනෙයි සිනිඳුවට
ඔපයකුත් තියෙනවා ඇති

මෙයටත් වඩා මුදු
සුව පහසු දැනවීය
පියගැට පෙළ එකල
සිප ගැනීම් හා තවත් මුරණ්ඩු
වැඩ කළ
සිඳ විදුලිය එසඳ
මැවුයෙමි කළුවර
මිහිර ඉමිහිර කරනුව

සුසුමක්ද බිරිඳගේ
දැනෙන්නේ පිටි අල්ලට
සිපගන්නට හදනවාද අත
මොනවා හිතනවාද ඇය
නැවතී හිඳිමුයි මොහොතකට
කියන්නට සිතෙයි

බිරිඳ අත කණ වැලට ගෙන
පිය ගැට පෙළ නඟින මට
දැනෙන වේදනා අපමණ

*(ගඟ වක් වී ගලන තැන කාව්‍යය සංග්‍රහයෙනි)*

## අයිසෙක් නිව්ටන් තුමනි දයාබර නැණ පහනින් ඔබ පලවා ලනු මැන අප අවිඳු ගනඳුර

කොලොන් නම් වන මේ ගස
උරා ගත්තේ කෙලෙස
මිහිකත රසෝජා

කියන් පිනැති මහතාණනි
රසායනයන් මිහිකතට හිමි
අන් ගසකට නොගොස්
මේ කොලොන් ගස තුළටම
ආවේ කොහොමද?
අහනවා මං ඔබෙන්
හොරකමක්වත් සිදුවුණාවද
මෙතන

මේ කොලොන් ගසද
අන් කොලොන් ගස්ද නොවන
ගස්වල
අත්තට රිකිල්ලට නටුවට
දළුවට
රසායනයන් ගෙන ගියේ
කවුරුන්ද?
නිවැරදි මාත්‍රාව වීද එහි?
මං අහනවා ඔබෙන්
කිරා බැලුවාද? කවුරුන් හෝ

අන් කොලොන් ගස් නොවන
අන් සියලු ගස් නොවන
මේ කොලොන් ගස අරා
පිපුණු ඒ මල් කැකුල
හිරුට මුහුණ ලා විකසිත වී
එලයක් වන්නට
කවර සංවාසයක යෙදුණෙද?
මං අහනවා ඔබෙන්
නියමයකට අනුව ද කවර?

මල එලයක් වී
කරලක් වී
වේළී වැටුණේ මිහිකත ළමැදට
ඔබ ගුරුත්වාකර්ෂණය
සොයාගන්නට පෙරදා රෑ
වැටුණු විදියටම නොවෙද?

## ලොකු ප්‍රේමේ

ලොකු ප්‍රේමේ
ගැට කපන්නාය
පිට දී හිඳින්නේ
ලෑලි බිත්තියට

ලිපට මුහුණ ලා
උක්කුටියෙන්ය බිරිඳ
ඇඟ දෙපසින් විහිදුවන්නේ
ගිනි දැල්

පරක්කුයි
රෑ කෑම හැමදාම
දැනුයි ගෙනාවේ
එළවළු මාළු
රස්සාවේ හැටියි මේ

පාඩම් කරයි ලොක්කී
තෙල් ටිකයි
ලාම්පුවේ ඇත්තේ

රතම තවරයි මුහුණේ
ලිපේ ගින්දර
චූටිගේ පොඩ්ඩිගේ
නිදන
බඩගිනි පැදුරේ

හිස නමාගෙන
අඳුරේ උලුවස්සෙන්
ඇතුළු වී අඳුරට
ලී වැටේ වාඩි වෙයි
ලොකු ප්‍රේමේ

ඔතා ගෙන සුරුට්ටුව
දරාගෙන දරුවන් සිතේ
පාවෙනා ඔහුට
යකඩ ගර්ජනාව
නෑසෙන්නේ
දහයයි තිහේ

# සිරියාවතීව නිදහස් කරන්න

(විත්තිය වෙනුවෙන් ගමේ නව තරුණ කැල පෙනී සිටිති.)

නඩුකාර හාමුදුරුවනේ
තරගයක් නොවෙයි මේ
කණා මුට්ටියට පොල්ලෙන්
ගැසීමේ

ගලවන්න ඔය
දෑස බැඳි පුස් පාංකඩය
බලන්න විත්තිකාරිය යැයි
කියනා
මෑ දෙස හැබැහින්

හැට්ටය ගලවා
පෙන්විය හැකිද වේදනාව
කිරි හිර වූ පියවුරුවල
කැක්කුම
මැගේ එකම එක සාක්කිය

පොලිසියෙන්
කර තියාගෙන ගෙනා මෙතැනට
කොස් කැපුව ලොකු පිහිය
උන්ගෙ මසුරන් සාක්කිය
පිළිගන්න පුළුවන්ද
හාමුදුරුවනේ

තිසා වැවෙන් නාගෙන
නෙළුම් මල් සතකුත් කඩාගෙන
පිරුවට හැඳ පේවීගෙන
එතැන ඉඳන් පයින්ම ගොස්
යට මළුවේ ලොවක් සුවඳ
කරන
සුවඳ දල්වා
උඩ මළුවේ තිස් තුන් කෝටියක්
පහන් දල්වා
පැතූ පැතුම හාමුදුරුවනේ
කුලුදුලේ පිළිසිඳුණු දරුවා

ෆැක්ටේරියේ වතුර ඇරියා
ඇළට
හැම වතුර බින්දක්ම විස වුණා
ගමේ
මීදුමක්ව රැඳී තිබී
වැස්ස එක්ක මාරා වේශව
ආවෙත් විසමයි
ඒ විසෙන්
මළ දරුවෙක් ප්‍රසූත කළේ මෑ
කෙටුවේ කොරියන් කාරයට
හොඳ සිහියෙන්මයි
කුරා කූඹියෙක් නොමැරූ මෑ

හැඬුවේ එතැනදී
ප්‍රාණඝාතයක් කළාටයි
විසි කළේ පිහිය
ලේ දකින්න බයෙනුයි

තීන්දුව දෙන්න පෙර
ගමට දවසක් එන්න
ඔය හැබෑ ඇස් දෙකෙන් එන්න

ගමේ කොලු පැටව්
පැටික්කියො ආපහු
පීනනවා ඇළ දිගේ උඩහට
හදිස්සියකට දුවන තිත්ත
පැටවුන් වගේ
ඉස්සර වගේම
පාන්දර ඉර එළිය කපාගෙන
අවුදින්
දිය බුං ගහනවා පිළිහුඬුවෝ

රංචු පිටින් දිය මකුළුවො
අවුදින්
රුවක් හොයනවා නැතිවුණු
ගල් අතර වතුරේ රූටමින්

ඒත්
හාමුදුරුවනේ
මොන සිරියාවක්ද
සිරියාවතී නැති ගම

## කොහෙද පියොවුර ඒ සුන්දර

ගඟ වක්වී ගලන තැන
ස්පර්ශ කළෙමි පෙණ පිඬු
ඉවසා බැරිම තැන
පෙණ පිඬු ඇසට මිස
ඇඟිලි තුඩට නොවේ

ගලන සඳ වතුරෙන්
දෝතක් ගෙන බීවෙමි
ඉවසා බැරිම තැන
සඳ වතුර ඇසට මිස කුසට
නොවේ

ස්පර්ශ කළෙමි
සිප ගත්තෙමි
ඉවසා බැරිම තැන
ඇසටමය පියොවුර
ඇඟිලි තුඩටය

කොහෙද පියොවුර අද
ඒ සුන්දර

ඇස වසා ගත්තද
ප්ලාස්ටරය පසුකර
ලේ පැල්ලම් මතුවෙයි
ශල්‍යාගාරයේ
මළ නොබැඳෙන වානේ තැටිය
මත
කපා ගත්තේ කොතනින්දැයි
හිතා ගන්නත් බැරි
අඳුනා ගන්නත් බැරි
මස් වැදැල්ල වටා යමි
නො අල්ලමි විමසමි

**(සඳුන් අරටුව දැල්වූයේ ඔබයි කාව්‍යය සංග්‍රහයෙනි)**

## සමුගත හැකි ද?

සියක් නෙත් අවි අතරේ
සොයනු හැකිවෙද ඒ නෙත

අවසාන සිප ගැනීමයි
සිප ගැනීමක් කර
සමුගැනීමේ කඳුළද හෙළා
සමුගෙනද අප

සුළැඟිලි බැඳෙයි
පැන් වත් කෙරෙයි
හදවත ගැහෙයි

නොපැමිණියාද
නොපෙනුණාද
සැඟවුණාද ඔහු

ජය මංගල ගී ඝෝෂාව අතරේ
අලුත් පාවහනට කැපී
රිදුම් දෙයි ඇස් වටය ළඟ
කූඹියෙක් දුවයි අත දිගේ

සමුගනු කෙලෙසද
නිය පහරක් සේ
කොතැනක හෝ සිරුරේ
ඔහු ඉන්නා විට

සංසාරේ කවදා හෝ
මුණ ගැසුණොත්
සිප නොගෙන ඉඳීවිද
අප දෙදෙනා

**(සඳුන් අරටුව දැල්වූයේ ඔබයි කාව්‍යය සංග්‍රහයෙනි)**